සන්න සහිත

# දහම් ගැටය.


ධර්මසෙන ස්ථවිරයන් විසින්

විරචිතයි.

ඇල්බට් ද සිල්වා මහත්මයා විසින්

සකස් කරණලදී.



ඇම්. ඩී. ඕ. පෙරේරා විසින්

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි

මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලදී.

COLOMBO.

1899

# දහම් ගැටය.

1 සේනලෙස නොවියතුන්
වියතුන් ඉස් සල සලා
සොයනෙව් අතුරු තෙපුල්
සවණ මිණෙව් දහම්ගැට ඇතිව පැළ

නොවියතුන්, අව්‍යක්තයන්; සෙනලෙස්හියන්; සෙට පරිද්දෙන්ද; වියතුන්, පණ්ඩිතයන්; ඉස් සලයාමෙනානද, වනා (ප්‍රකාශකරණ පරිද්දෙන්ද) අතුරුතෙපුල, යත්; සොයනෙව්, සොයන්නාක්මෙන්; සවණ මි... කුණ්ඩලාභරණයක් වැනිවූ; දහම්ගැට, ධර්මප්‍රශ්න (ප්‍රබන්ධයක් කරමි.)

2 සාවක සඳින්ගෙණ
පාදම් අටක්ගැටලා
සතර පා ගිසලා
එම පාදමින්බැඳ පවිම් අද.

සාවක, ශ්‍රාවකයන්ගේ; සඳින්, සිහින්; ගෙණ, ඇර ගෙණ; පාදම්, පාලිධර්මය නැමැති; අටක්, මුතුවැලක්; ගැට ලා, බෙල්ලේදමා; සතරපා, සර්වඥයන්වහන්සේගේ ශ්‍රී පාදය; ගිසලා, ගිසෙහි පිහිටුවා; එම පාදමින්බැඳ, එම්පාලි ධර්මයෙන් රචනාකොට; අද, අමුතුව; පවිම්, ප්‍රකාශකරමි.

3 මීඅඹ සක්කරා
බඹරා සඳපාත කා
ගවයත් බණ මගණ
සවණ දෙව්ලෝ අනත්සුවදේ.

මීඅඹ, මයිකාණතාවය; සක්කරා, ශක්‍රයාය; බඹරා, බ්‍රහ්ම යාය; සඳපාත, චන්ද්‍රයාය; කා, ආකාශය; ගවයන්, ඊශ්වර යාය; බණ, ධර්මය; මගණ, ශ්‍රමණය; සවණ, සර්වඥය; දෙව්, (යනමේ) දිව්‍යාඞ්ගනයා; ලෝ, ලොකයාට; අනත්සුව දේ, අනන්ත සුඛදායක කෙරේවා.

4 සඳුන් සුනු පල්ලේ
තිය මීඅඹ සකාරා
කිරිදී මෝරුගෙණ
වදුරුනැඟි දූරියන් සරණ යව.

සඳුන්, සඳ්‍රීන්ද; සුනු, පුනුයන්ද; පල්, මස්ද; ලේ, ලේද; තිය, වාහනද; කිරි, ඇතුන්ද; මීඅඹ, මහීකාන්තාව; සකාරා, ග[illegible] [illegible]සකොට; මෝරුගෙණ, ගිරිමෙඛලා නම් [illegible]ාට; වදුරුනැඟී, වජ්‍රාසනාරූඪවූ; දූරියන්, [illegible]නායන්ගේ; සරණයව, සරණෙහි පිහිටව.

5 මග මී සත සලා
පිලවුන් මැඩ වල දමා
සඳුන් පැන් වත්කොට
දී වළඳ වදුරු නැංගේ.

මහමී, මහපොළව; සත, හත්වරක්; සලා, කම්පාකරවා; පිලවුන්, දරුවන්; මැඩ, මලානිකකොට; වල, වනයෙහිදී; දමා, පරිත්‍යාගකොට; සඳුන්, සඳ්‍රීන්ද; පැන්වත්කොටදී, අතපැන් වත්කොට දීලා; වළඳ, දානවශයෙන්දී; වදුරු නැංගේ, වජ්‍රාසනාරූඪවූයේ.

6 තපසිවරිනි දූන්
සහසා තණ මරන්නේ
දෙනෙත හෙලිකොටගෙණ
සැබෝ මතුකොට ගන්නේ,

තපසිවරිනි, තපසට කැමැත්තෙනි; දූන්, වනයෙන්; සහසා, සාහසිකව; තණමරන්නේ, තෘෂ්ණාව විනාශකරන්නේය; දෙනෙත, දෙනෙත්‍රය; හෙලිකොටගෙණ, ශුද්ධකොට ගෙණ; සැබෝ, බොධිවෘක්ෂ; මතුකොටගන්නේ, අනාගත කාලයෙහිකොට ගන්නේයි.

7 කබල නොබිදෙන තුරු
ලුණුලා අද තුබුනම්
කබල බුනෝයිනුත්
ලුණු නොතයි සෙවවනතුරු

කබල නොබිඳෙන තුරු, ශරීර බලය නොනස්නාතෙක් අද, යිතෙයි; ලුණුලා තුබුනම්, කරුණාව ඇතිව තුබුනි නම්; කබල බුනෝතිනුත්, ශරීරබලය බිඳුනත්; සෙට වනතුරු, උතුම්බවට පැමිණෙන තෙක්; ලුණුනොතයි, කරුණාව හානිනොවේ.

8 නොලදින් දූත් කසා
සමණින් හිසායත දූරියන්
සඳුන් සුනු තබා
නොබාස්ත්නේ කසාවත්යට.

දූත්, මේකාලයෙහි; කසානොලදින්, කාසාවස්ත්‍රනොලදුනම්; සමණින් සොයන, ශ්‍රමණ භාවය සොයන්නාවූ දූරියන්, ධෛර්‍ය්‍යවන්තයන් විසින්; සඳුන්, ඥාතීන්ද; සුනු, පුත්‍රයන්ද; තබා, හැර; නොබා, හඬනැතිව; කසාවත්තට යන්නේ, කාසාවස්ත්‍රයට යන්නේය (හෙවත්) පැවිජ් වන්නේය.

9 ඉස්සන් සොයාගොස්
සැඟැසී රණ්ට නොලදින්
දල පිස පණු පොවා
මගදිරා කලයෙන් හැරපී.

ඉස්සන්, ඍෂිවරයන්; සොයා, පරීක්‍ෂාකොට; ගොස්, ගමනයකොට; නොලදින්, දුලීබකින්ද; දළ, ජවාද; පිස, පහකොට; පණුපොවා, ප්‍රඥාතුහාවකරවා; මගදී, මාර්ගහදනය කොට; කැලයෙන් කායචිත්තයෙන්; රා, කෙලෙසයන්; හැරපී, විප්‍රකාර කෙළේයි.

10 අරේ පිබිදගොස්
දසක් දමා ඉන්යත්
රත්දී රිදීගෙණ
එම ඉස්සත් ඉසපිසී

අරේ, ආයුෂ්මතම; පිබිදගොස්, ප්‍රබොධව ගොසින්; දසක් ඉන්සත්, සගසුප්‍රමාණසෘෂිවරයන්; දමා, දමනයකොට; රත් දී, වනයෙහිදී; රිදීගෙණ, සෘද්ධිපදවා; එම ඉස්සත්, එම සෘෂිවරයන්; ඉසපිසී, ඉසකේකැප්පවී.

11 සමණින් දුක සැකිරි
පිසදී සතර පස්ද
නිවන් යන දූරියෝ
තවත් සමණන්වම දිවි පුදත්

නිවන්යන දූරියෝ, මොක්ෂයට යන ධෛර්‍ය්‍යවන්තයෝ, සමණින්දුක, ශ්‍රමණයන්දුකලා; සැකිරිපිස, සකීශභාවය අත්හැර; සතරපස්දදී, චතුර්ඃබ ප්‍රත්‍යඃසදනයන්දී; තවත්, නැවතත්; සමණින්වම, ශ්‍රමණයන්වම; දිවි පුදත්, ජීවිත පූජාකෙරෙත්.

12 තණ ද වලට ගොස්
අඹරා ගණුව පාදම්
කුණු අමුඩු ගලවා
මොරපු දූර්යෙනි නිවන්යව්.

තණද, තෘෂ්ණාවනැතිකොට; (නැවත) අඹරාගණුව පාදම්, පාලිධම්ය ඉගෙණ ගණුව; කුණුඅමුඩුගලවා, උකුණු කෙස්වැටිය පහකොට; මොරපු, මෝහරාගය හැර කුසල මූකරවාගත්; දූරියෙනි, ධෛර්‍ය්‍ය වන්‍යයෙනි; නිවන්යව්, නිර්වාණයට සම්ප්‍රාප්තවව්.

13 රාකලයෙන් ගෙණ
ඇමපිසදී නොසිද
ඉන්සන් ඇහිලිඩේලා
වල්ගොස් සාවූන් ගන්නේත්

ඇමි, සියලුසත්ත්වයන්; රාකලයෙන් පිසදී, කෙලෙශමිත්‍ර යෙන් පහකොට; ඉස්සන්, ඍෂිවරයන්; ඇතිලිගේලා, ඇතු ලෙහි බහාගෙණ; තොයිඳ, තොම්සිට; වල්ගොස්, වනයට වැද; සාවුත්ගත්තේ, ශ්‍රාවකයන් ගත්තේයි.

14 ලුණුදිය ඉසලා
පල්ලේ සඳුන් සුණුහෙලා
කිරි සකාරා මිදී
මුදවා බුදුගත්තෝ

දිය, ලොකයෙහි; බුදුගත්තෝ, බොධිඥානය සම්බන්ධනම කරණුවෝ; ලුණුලා, කරුණාවබනා; හිස, මස්තකයද; පල්, මස්ද; ලේ, රුධිරයද; සඳුන්, ස්ත්‍රීන්ද; සුනු, පුත්‍රයන්ද; හෙලාකිරි, සුදුඇතුන්ද; මී සකාරා, මහීකාන්තාව සමපා කරවා; දී, දානයකොට; මුදවා, සංසාර ගෘහයිය මුක්ත කරවා.

15 වැරසැර පිරිමියෙක්
තෙමේ දවල් ගොස්සිට
සතක් කැහිගෙන්වා
එකැහිය් සත් වත්ය ඉදිකෙලේ

තෙමේද, තේමියජාතකයෙහිදී; වල්ගොස් සිට, වන ප්‍රවිෂ්ටව; සතක්කැතිගෙන්වා, පරිවාරක්ෂත්‍රියයන් සත් දෙ නෙකුගෙන්වා; එකැතින්, එකාන්තයෙන්; සත්වත්ය, ඒ සත්ත්ව වස්තුව; වැරසැරපිරිමියෙක්, වීරසාර පුරුෂයෙක්; ඉදිකෙළේ, තැනී.

16 ඉස්සන් සොයත්නත්
ලුණුලා අද ඉසිපණු බොත්නේ
දඩ වැද සතුන්විද
වටනාකා නිවන් යත්තේ,

ඉස්සන්, ඊෂ්‍යාවන්; සොයන්නන්, පහකරන්නන්විසින්; අදළ ඥලා, සිත්හි කරුණාව බහා; ඉසිපණු බොත්තේ, ඊෂ්‍යී ප්‍රාර්ථනා කරන්නේයි; දඩවැද සතුන්විද, වනයට ගොස් සත්‍යය අවබෝධකොට; වමනාකා; කාමකෙලෙශ නසා; නිවන්යන්නේ, නිර්වාණයට යන්නේයි.

17 කොසලා එදදුන්
පිරිගෙන් පූ පිසූගෙන්
සයින් සිට සත්ද
දී දවහල සතර මස්සක්

සතර, සම්පූර්ණතම; එද, ඒ මාරපුබදීනයෙහි; කොසල්, නිශ්චලව; දුන්පිරිගෙන්, පිරිවනලෙන්; පූ පිසුගෙන්, පූජි ජාතිඵලහෙයින්; සත්දසයින් සිට, සත්දවසක් නිරාහාරයෙන් සිට; මස්සක්දී, මස්ඇස්දී; දවගල, දීන පසු ක්ෂේළයි,

18 පූ පිස තබාලා
බණගෙට ගොස් සගින්ඉඳ
දම්මා දම්සගුණ බලා
සත් දවසකින් නිමවූ.

පූපිසතබාලා, පූජිජාතිනැතිකොට; බණගෙට ගොස්, ධර්ම ශාලාවට ගොස්; සයින්ඉඳ, නිරාහාරයෙන් සිට; දම්මා, ධර්ම ස්වාමිතෙම; දම්සගුණ, ධර්මසංගණිකාව; බලා, මෙනෙහි කර; සත්දවසකින්, සත්දිනයකින්; නිමවූ, නිෂ්ඨා කෙළේයි.

19 ආදි දූරි ඇත්තෙන්
අඹුවන් මරා ලුහුබැඳ
අද පාමුල සයින්
සද්ද උන්නු සමණෝ

දූරී, දෛන්‍යවසනවූ; සමණෝ, ශ්‍රමණයෝ; ආදී, පූර්ව කොට; දූරිඇත්තෙන්, දෛන්‍යය ඇතිවූහෙයින්; (බුදුවූහෙයින්) මරාඅඹුවන්, මාරාඞ්ගනාවන්; ළුහුබැඳ, පන්නා; අද පාමුල, අජපාලමූලයෙහි; සයින්, නිරාහාරයෙන්; සද්ද උන්නු, සතියක් සිටියෝය.

20 දූත් පුහුදුන්නෝ
නරකය ලැබෙත් එත්
සැබවිය නොලබන්නේ
නිරකය පුහුදුන්නන්.

දූත්, මේකාලයෙහි; පුහුදුන්නෝ, පෘථග්ජනයෝ; එත්, අනාගතයෙහි; නරකය, අපාය; (මනුෂ්‍යත්වය) ලැබෙත්, ලබද්ද වෙති; පුහුදුන්නන්, පෘථග්ජන නොවන්නෝ; නර කය, අපාය(මනුෂ්‍යත්වය) නොලබන්නේ සැබවිය, අලබ්ධ වන්නේ එකාන්තයි.

21 සමණෝ දූරි ඇත්තෝ
මම දූරි නැත්තෙමි
තොප සබලෙනි මතු
නැනට මා දූරි ඇතිවන්නේ.

සමණෝ, ශ්‍රමණයෝ (සමිඳුවරයෝ) දූරි ඇත්තෝ, ධෛර්‍ය ඇත්තෝය; මම දූරිනැත්තෙමි, මම වනාහි ධෛර්‍යහීනවෙමි; (ඒ හෙයින්) නැනට, ඥානයට; මතු, අනාගතයෙහි; මා දූරී ඇතිවන්නේ, මාගේ ධෛර්‍ය ඇතිවන්නේය.

22 දූරි ඇතිවිම් නම්
නැනාහා එකඟ යෙම්නම්
සමණුන් ඇයිද මට
දූන් රාපලාවක් ලදිම්නම්

දූරිඇතිවිම්නම්, ධෛර්‍යවනාවීනම්; නැනාහා, ප්‍රඥාව හා සමග; එකඟ යෙම්නම්, එකමාගීයක යානම්; රාපලා, කෙලෙශ පහකොට; දූන්, ධ්‍යානයෙන් යුක්තව; වක් ලද්දේ නම්, ශීඝ්‍රලද්දෙම නම්; මට සමණුන් ඇයිද, මටශ්‍රමණ යන්ගෙන් කම්කිම්ද?

23 තව එහරනොගියෙම්
සමණෙනි මානියෙනි
සහරවන මහලේ
ඇරණ්දී මා එහරලන්නේ

භව එතරනොගියෙමි, මේ දක්වා (සංසාර සාගරයෙන්) එතර නොපැමිණියෙමි; සමණෙනි, ශ්‍රමණයෙනි; මාහි මෙහි, මාගේ ප්‍රඥාවෙහි; සතරවන මුහලේ, සම්ඥුව උප දීන මඞ්ගල්‍යයෙනි; සරණදී, ප්‍රතිඥාදායකව; මා එතර ලන්නේ, (සංසාර සාගරයෙන්) මා පාරප්‍රාප්ත කරන්නේයි.

24 බාවා නුමුත්වග
නැත දක්නාතෙක්
බොරපු කල දෙව එතර
වන්නට සිතමු සුබසෙත්

සෙත්සුබ, ශාන්තියෙන් පැමිණීයේනම්; බාවානුමුත්, භාවනාවෙන් අමුක්තව; මගනැත, මාර්ගඥානයද; දක්නා තෙක්, දර්ශන කරණතාක්; බොරපු, මොහරාගයෙන් බාධ කළු; කල, කායවිඥානය; දෙව, පරිශුද්ධකොට; එතරවන්න ට,(සංසාර සාගරයෙන්)එගරවීමට; සිතමු, චින්තනයකරමු.

25 කාබවා වල්ගොස්
සතුන්විද සම්හැරගෙණ
මගමුවා පලාදකු
ගොස් වන පියානන්

කාබවා, කායගතා භාවනාකොට; වල්ගොස්, වනයට පැමිණ; සතුන්විද, සත්‍යාවබොධනයකොට; සම්හැරගෙ ණ, ශ්‍රමණිය ගුහණයකොට; මගමුවාපලා, මාර්ගඥානයට ඇතුල්ව; වනපියානන්, පංචස්කන්ධනකලාවූ පීතෲනු; ගොස්, ගමනයකර; දකු, දර්ශනයකරව්.

26 දරසොයා නොයව්
සතුසොයා වලටයව්
තම්පලාකඩව්
නැත නිත්තෙන් පූ පිසම්

දීර්ඝසංසා නොසැව්, දරුවන්සොසා ගමනය නොකරව්; සතුංසොයා, චතුස්සත්‍යය පරීක්‍ෂාකොට; වලටැව්, වනයෙව ගව්; තම්පලා, මොහය දුරුකොට; සැඩව්, භග්නකරව්; නැණ, ඥානවන්තයෙනි; නිත්නෙත්, නිරන්තරයෙන්; පූ, පුව්ජනිය; පිසව්, තුච්ඡකරව්.

27 දරසොයන දූරියෙනි
කවුදර නොඇල්ලන්නේ
පැලිදර සොයන්නේ
පැලිදර බෙලෙනි පූ පිසන්නේ.

දරසොයන දූරියෙනි, දරුවන්සොයන්නාවූ බෞද්ධ වනිතාවෙනි; කවුදර නොඇල්ලන්නේ, කාකීන දරුවන් නොසොයන්නේය; පැලිදර සොයන්නේ, ව්‍යාඝ්‍රදරුවන් සොයන්නේය; පැලිදරබෙලෙනි, ව්‍යාඝ්‍රදරුවන්ගේ අනුබලයෙන්; පූපිසන්නේ, පුව්ජනීන් තුච්ඡකරන්නේයි.

28 වදුරු නැඟෙන්නට
දුනුමැතියෝ පලමුද
සක්සුනු සඳුන් පැන්දී
කිරිමුදත් මී කකාරා

දුනුමැතියෝ, ඥානවන්තයෝ; වදුරු නැඟෙන්නට, වජ්‍රාසනාරූඪවෙන්නට; පලමුද, ප්‍රථමජාතියෙහි; සක්, ඇත්ද; සුනු, දරුවන්ද; සඳුන්, සත්‍රීන්ද; කිරි, ඇතුන්ද; මීකකාරා, පොළව ගුගුරවා; පැන්දී, අත්පැන්වත්කොටදී; (සව්නේ දූන) මුදත්, (සතවයත්) මුදුහරිත්.

29 රන්දී පන්සිල්ගෙණ
දූරිඇති මෝරා දෙසිපැණ
කඩාකාගී සිනෙත්
මහපලා බව් දනුව

රත්දී, වනාසෙහිදී; පන්සිල්ගෙණ, පඤ්චසීලයන්ගෙණ; දුරිඇති, දෛවැසී ඇත්තෙනි; මෝ, මෝහයාද; රා, රාගයාද; දෙයි, ද්වෙෂයාද; පැනා, ප්‍රඥාවෙන්; කඩා, පහකර; කායි සී ගෙනත්, කායගතා සංඝියිඥානයෙන්; මහිපලා, මාගීඵල ගනව; බව, (අවසීණීවූ)භාවය; දනුව, අවබොධකර.

30 තියඹරමල් සමයට
හැමදූරියෝ දූමුදුවෙත්
කැකිරිදලු කඩත්
කූර සාමුලුයෙන් උපුටත්

තියඹරා, තිඹුවූරාගය; මල්සමයට, මැලවුනාවූ කල්හි; හැමදූරියෝ, සියලු ධීරයෝ; දූමිදුවෙත්, ජාතියෙන් මිදුනෝ වෙති; (එකල) කැකිරි, කකීශභාවය; දළුකඩත්, දළුහ වෙදනය කෙරෙත්; කූර, ක්‍රුරභාවය; සාමුලුයෙන්, සියලු අත්දමින්; උපුටත්, උඟුලාදමත්.

31 දිවියා නොයනතුරු
වල්පත ගණුව ඉඳුරා
පලාගිය හමුත් දිව
සමවරදී බවා තරවා

දිවියා නොයනතුරු, ජීවිතය අභික්‍රාන්ත නොවනතුරු; වල්පත, වනයටගොස්; ඉඳුරාගණුව, ඉන්ද්‍රිය ඊක්ෂණය කොට ගණුව; දිවි, ජීවිතය; පලාගියහමුත්, අතික්‍රාන්තවූනමුත්; සමවරදී, කාමසම්පත්තියෙන් විරුඩව; බවා, භාවයකර; තරවා, තිරකරු.

32 තම්පලා කඩව්
සිහපි විශෙණ්‍ය වනව්
තෙල්සොයා දිවව්
කබල බිඳලා හැන තොමැසෙව්

කූඩෑත, ඥාතයන්; තම්පලා, මොහැදුරුකොට; සැඬවූ, ඡේදනය කරවී; සිනරි, සමෘද්ධිවත්ව අශ්ටිඝන සතිභාව නාව; වී, සුහුව; ගෙණිවතව, ගෙණිවත්‍රාප්තකරවී; තෙල් සොයා, යෙනහසු පහකොට; දිවචී, ධාවිතයකරවී; කබල බිඳලා, කායබලබිඳදමා; නොමැසෙව්, පසුතැවිලිනොවව්.

33 සැසි පතාලත්
නැත සමණින් ඉන්දදී
සර නැහීයෙම් අනිස
පරසමණින් ඇයිද මට

පතාලත්, ප්‍රාප්තනාවෙන්ලැබූ; සැසිසමණින්, ශාක්‍යසිංහ ශ්‍රමණයන්; ඉන්දදී, සිටිනදී; අනිසසර නැහීයෙම්, අනි ත්‍යාදිකොටැත්තෙමී; නැත, ඥාතයට; පරසමණින්ඇයිද මට, බාහිර ශ්‍රමණයන්ගෙන් මට කම්කිම්ද?

34 සමණෝ කිපෙත් නම්
තවනම් කෙසේ සතහම්
සමණෝ දත්තූනම්
වැද්ද නොමදෙයි කසාවත්තට

සමණෝ, ශ්‍රමණයෝ; කිපෙත්නම්, කොපවෙත්නම්; (එකල) තවනම් කෙසේ සතහම්, තවත් කොයිඅන්දමින් යොනාහකොරෙම්ද; සමණෝ දත්තූනම්, ශ්‍රමණයෝ (දෘෂ්ටිගත පරීක්ෂා කාරාදීන්) දූහගත්තනුනම්; කසාවත්තට, කාෂා වස්ත්‍රයට; වැද්දනොමදෙති, පැමිණීමට ඉඩනොදෙත්.

35 තාපසිවරිති දූන්
සීනරි වී වනාලා,
සමහ වළඳත්තේ
අතිස පූ පිය සතර සත්තෙෂ්

තපස්විවරිනී, තපොළදවරුනී; දුශ්ශීල, ධනාතුරාංගයෙන්; ඇරී, අභ්‍යුපගතාසයි; ඒ, වහාම; වහාලා, වහාපාන කොට; අනිය, අනිත්‍යයෙන්; පූජිය, පූජිතනීන්ගැර; සතර සත්‍යයෙන්, චතුරාර්ය්‍යසත්‍යයෙන්; ඇමග, සම්‍යක්මාර්ගඵල ය; වළඳත්තේ, අනුභවකරන්නේයයි

36 පල්පලා දෙන්නේ
සක සාබත්බලාලා
එද අග නැංගේ
මෙද සාදු මිරුන්බුත්තේ

සාද, සසජාතකයේදී; සක, ශක්‍රයාගේ; සාබත්බලාලා, සාගිණී ඇතිබව දැක; පල්පලාර්දන්නේ, මාංසඵල දානය කරන්නේ; එද, ඒ ජාතකයෙහි; අගනැංගේ, ගින්නට පැන්නේයි; මෙද, මේ ජාතියෙහි; මරුන්, මාරයන්; බුන්නේ, භග්න කෙළේයි.

37 දියපිට ඉස්සත්
යන්නා දැක දනාමින්
දමා දලබලි සාවක
ගත්තන් දනු මෙදියේ

දියපිට, ජගත්මධ්‍යතකයෙහි; ඉස්සත්යන්නා දැක, සෑළිවි රජුන් යනුදැක; මින්, ශ්‍රද්ධාය; උදනා, උපදවා; බලි, මහත් වූ; දලමා, භුන්ඵබුර ගැර; සාවක ගත්තෙන්, ශ්‍රාවකභාවය ගත්තවුන්; මෙදියේ, මේලොකයෙහි; දනු, අවබොධ කරව.

38 කරාවට නොගොස්
දමක්ණ කොස්ලුනම්
අඩා බග පලාගෙණ
මෝරාගිය කියන්නෙම්

කරාවට, කර්කශ භාවයට; නොහොස්, නොපැමිණ; කණ්ණ, කණ්ණෙහි; දුමකොස්ලූනම්, ධර්මසම්පත්තිය දුම්නම්; අඹා, එහාම; මගපලාගෙණ, මාර්ගඵලග්‍රහණය කොට; මෝරාගිය, මෝහ රාගයෙන් යුක්තකල්හි; කියන්නෙම්, ප්‍රකාශකරන්නෙම්.

39 සිවැස්සෙති පතව්
නරකය සරාකාලේ
සතරපස් සාවකගෙණ
මස්පිසන්නේ නරකයෙති

සිවැස්සෙන්, සමෘද්ධිසම්ප්‍රාප්තව වසන්නෙහි; සරා කාලේ, බුද්ධොත්පාදකාලයෙහි, නරකයපතව්, මනුෂ්‍යාත්මභාවය ප්‍රාර්ථනා කරව්; (හේ කිමද;) සතරපස්සාවකගෙණ, බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රාවකත්වයගෙණ; මස්පිසන්නේ, මාංසයකී දී දෙස්පශකරන්නේ; නරකයෙති, මනුෂ්‍යත්වභාවයෙනි.

40 නරකය පතන්නේ
ලූණුලා බත් පිසන්නේ
ඉසිපණු බොන්නේ
සුවදියෙනි සෙට බුදුවන්නේ

නරකය පතන්නේ, මනුෂ්‍යාත්මය ප්‍රාර්ථනා කරන්නේ ය; ලූණුලා, කරුණාව බහා; බත්පිසන්නේ, භක්තිපොෂණය කරන්නේය; ඉසිපණුබොන්නේ, ඍෂිප්‍රඥවෙන් යන්නේ ය; (ශීලසංරක්‍ෂණය කරන්නේයි) සුවදියෙනි, සැපදායක කිරීමෙන්; සෙට, ශ්‍රෙෂ්ඨව; බුදුවන්නේ, බුද්ධත්වයට පැමිණෙන්නේය.

41 වලසුන් හැර විගුන්
දලබිද සක් දමාලා
මගදී එවියසම
නැගී අටලොස් කෙළක් පණුවන්

තපසිවරිනි, තපොඇදුවරුනි; දුශ්ශීල, ධුතාඞ්ගධාරී යෙන්; ඇලි, අශුචිගතාසනි; ඒ, වහාම; වනාලා, වනාපා කොට; අනිය, අනිත්‍යයෙන්; පූජිස, පූජිජනින්ගැර; සත ර සත්තෙන්, චතුරාසම්සත්‍යයෙන්; අමග, සම්සීයමාගීඵල ඝ; වලදුන්නේ, අනුභවකරන්නේයි

36 පල්පලා දෙන්නේ
සක සාබන්බලාලා
එද අග නෑංගේ
මෙද සාද මිරුන්බුන්නේ

සාද, සසජාතකයේදී; සක, ශක්‍රයාගේ; සාබන්බලාලා, සාගිණි ඇතිබව දැක; පල්පලාර්දන්නේ, මාංසඵල දානය කරන්නේ; එද, ඒ ජාතකයෙහි; අගනැංගේ, ගින්නට පැන්නේයි; මෙද, මේ ජාතියෙහි; මරුන්, මාරයන්; බුන්නේ, භග්න කෙළේයි.

37 දියපිට ඉස්සන්
යන්නා දැක දනාමින්
දමා දලබලි සාවක
ගත්තන් දනු මෙදියේ

දියපිට, ජගත්මාතකයෙහි; ඉස්යන්යන්නා දැක, සංඡීව රජුන් යනුදක; මින්, ඥානය; උදනා, උපදවා; බලි, මහත් බූ; දලමා, භුන්ථබුර ගැර; යාවක ගත්තෙන්, ශ්‍රාවකභා වය ගත්තවුන්; මෙදියේ, මේලොකයෙහි; දනු, අවබොධ කරව.

38 කරාවට තොගොස්
දමක්ණ කොස්ලුනම්
අඩා බග පලාගෙණ
මෝරාගිය කියන්නෙම්

කරාවට, කර්කශ භාවයට; නොගොස්, නොපැමිණ; කණ්හි, කණෙහි; දමකොස්ලූනම්, ධර්මසම්පත්තිය දැමූනම්; අඹා, වහාම; මගපලාගෙණ, මාර්ගඵලග්‍රහණය කොට; මෝරාගිය, මෝහ රාගයෙන් යුක්තකල්හි; කියන්නෙම්, ප්‍රකාශකරන්නෙමි. '

39 සිවැස්සෙනි පතව්
නරකය සරාකාලේ
සතරපස් සාවකගෙණ
මස්පිසන්නේ නරකයෙනි

සිවැස්සෙන්, සමෘද්ධිසම්ප්‍රාප්තව වසන්නෙහි; සරා කාලේ, බුද්ධොත්පාදකාලයෙහි, නරකයපතව්, මනුෂ්‍යාත්මභාවය ප්‍රාර්ථනාකරව්; (හේ කිමද;) සතරපස්සාවකයගෙණ, බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රාවකත්‍රයගෙණ; මස්පිසන්නේ, මාංසයකී දී දෙස්පහකරන්නේ; නරකයෙනි, මනුෂ්‍යාත්මභාවයෙනි.

40 නරකය පතන්නේ
ලූණුලා බත් පිසන්නේ
ඉසිපණු බොන්නේ
සුවදියෙනි සෙට බුදුවන්නේ

නරකය පතන්නේ, මනුෂ්‍යාත්මය ප්‍රාර්ථනා කරන්නේ ය; ලූණුලා, කරුණාව බහා; බත්පිසන්නේ, භක්තිපොෂණය කරන්නේය; ඉසිපණුබොන්නේ, සම්ප්‍රඥාවෙන් යන්නේ ය; (ශීලසංරක්‍ෂණය කරන්නේයි) සුවදියෙනි, සැපදායක කිරීමෙන්; සෙට, ශ්‍රෙෂ්ඨව; බුදුවන්නේ, බුද්ධත්වයට පැමිණෙන්නේය.

41 වලසුන් හැර විගුන්
දලබිඳ සක් දමාලා
මිගදී එව්යසම
නැගී අටලොස් කෙළක් පණුවන්

වල, වනයෙහිදී; අසුන්හැර, ආසනයට නැගී; දමායක්, ධම්මචක්‍රයක්; වහුන් දලබිඳලා, (පණුව) වර්ගීයන්ගේ ම්‍රානය බිඳදමා; එවිගසම, එකෙණෙහිම; මගදී, මාර්ගඵලදී; අට ලොස් කෙලක් පණුවන්, දහඅටකෝටියක් ප්‍රාණීන්; නැගී, (සංසාරයෙන්) උතාරී ශීකෙළේයි.

42 දඹුකඩ තමා කා
සතුරන්ට බත්දෙන්නේ
මගඵුන් බවන්නේ
තතරන්වයින් නිවන්යන්නේ

දඹුකඩ, ධම්මසකඩනොකොට; තමාකා, ස්කීයඝර්‍ානයෙහි අනුභවකර; සතුරන්ට, අසමිතුරන්ට; බත්දෙන්නේ, භක්තිදානය කරන්නේය; මගඵුන්, මගඵලදම්; බවන්නේ, භාවනාකරන්නේය; තතරන්වතින්, ආරණ්‍යව්‍රත කරණයෙන්; නිවන්යන්නේ, නිර්වාණයට යන්නේයි.

43 ගුණගෙණ පාපියා
කලයේ රා බිපියා
මසුරන් ඉසපියා
නිවන්යන්නේ තණ දපියා.

ගුණගෙණ, ගුණඇරගෙණ; කලයේ, කායජිනයෙහි; රා, රාගය; බිපියා, සුන්කරදමා; මසුරන් ඉසපියා, මසුරුගුණයන් හැර; තණ්දපියා, තෘෂ්ණාව හැරදමා; නිවන්යන්නේ, නිර්වාණයට යන්නේ; පාපියා, පාප පහකොටයි.

44 දිරාලෙඩ මල
සමණන්දක සතොස්මින්
සැහැසි එදා දුරිගියොත්
එරාහුල්ලා පියවා.

සැනසිඳුරි, ශාකසිංහ ධීරතෙම; එදා, ඒදිනයෙහි; දිරා, ජරාවතිණ්ණ; ලෙඩ, රෝගාවතිණ්ණය; මළ, මරණාවතිණ්ණය; සමණුන්, ශ්‍රමණයයි (යන සතරාකාර පූර්වනිමිති) දැක, දර්ශනයකොට; සංතොෂ්මින්, සන්තාපවෙමින්; එ රාහුල් ලාපියා, ඒ රාහුල කුමාරයන් හැර; ගියෝ, ගියාහ.

45 සව්ලයන් ඇතැයි
මඟුලට පටන්ගෙණිලා
නැත්තෙන් සව්ලයන්
මඟුල්තිබියේ එරාහුල්ලා

සව්ලයන්, සත්පුරුෂයන්; (සිද්ධාර්ථකුමාරයන්) ඇතැයි විද්‍යමානයයි; මඟුලට, මඞ්ගල්‍යයට; පටන්ගෙණිලා, ප්‍රාරම්භකොටලා; සව්ලයන් නැත්තෙන්, ඒ සත්පුරුෂයන් නැතිනිසා; එරාහුල්ලා, ඒ රාහුල කුමාරයාගේ; මඟුල් තිබියේ, මඞ්ගල්‍යයට බාධාකෙළේයි.

46 සැහැසි කතුරුදිය
රසබිතුවු බුරුංගා
අවල කෙළි කෙළිදු
කැඩුව වතු අත්තෙන් තම්පලා

සැහැසිකතුරු, ශාක්‍යසිංහ ක්ෂත්‍රියයාගේ; දියරස, ක්ෂීර රස; බී, පානයකොට; තුටුබුරුංගා, දෙවියන් සිත්සතුටු කර; අවලා, සම්පූර්ණව; කෙළිකෙළිදා, ක්‍රීඩාකළ දිනයෙහි; වතු අත්තෙන්, සිහින් සිත; තම්, මෝහය; පලා, දුරු කොට; කැඩුව, ඡේදනයකොටපිය.

47 අඹු පියදම්ලා
සිල්කලයේ පුරාගෙණ
නිවත්යන දූරියෙකි
සතර බඹවර කරඹුවේ ලව්.

නිවන් සත දුරියෙනි, නිර්වාණයට සත ධෛර්‍ය්‍යයෙනි; අඹුපිස, සත්‍රිත්හැර; දවාලා, ධ්‍යානකොට; කලයේ, කාය විජ්‍යාගෙහි; සිල්පුරාණෙහෙණ, සිල්පු ස්වර්ණකරගෙණ; සතර වර, උතුම් ශාසනානුගේ; බණ, ධර්මය; සුරඹුවේ ලව්, කාණ්ගෙහි බහාලව්.

48 මීදෙන දමාපී
වස්සන් උනාපී
අඹුඹු ගලවාපී
ගොපළු දිවගොස් ලොවළදපී

මීදෙනදමාපි, මහීධනය අත්හැර; වස්සන්, සංසාර වැස්සන්; උනාපි,එතරකොළේයි; අඹුඹුගලවාපි, කෙස්වැපිය හැරදමා; ගොපළු, මහීපාල ව්‍යූ ඒ සිඩාජිවකුමාර)තෙම; දිව ගොස්, මහබිණික්මන්කොට; ලොවළඳපි, නිවන්රස අනුභව කෙළේයි.

49 ඇදුරා නැගුගෙයි
දඹුපත්ගැම විදුහැර
මඩුළු සුන්බුන්කොට
තෙපි බුදුවන්නට තණ දවව්.

ඇදුරා, තෘෂ්ණාව නැමති ආචාර්‍ය්‍යනි; නැගුගෙයි, කරණ ලද ශරීර නැමති ගෘහයෙහි; දඹුපත්, කෙලශ නැමති ගෘහොපකරණයෙන්; හැම, සියලූ අත්දමින්; විදුහැර, දුරුකොට; මඩුලූ, කර්ම නැමති ගෘහසථයන්; සුන්බුන්කොට, සිඳබිඳදමා; තෙපිදු, තොපිද; බුදුවන්නට, බුඩත්වයට පැමිණීමට; තණ දවව්, ආශා පහකරව්.

50 වඳිම් තුන්ලෝ නැති
නුපන්බුදුන් නොමියන
සතර ඉරියව්වෙන්
රුසිරිදී දම් දෙසුවන්

දූපත්, ප්‍රසූතනුවූ; නොමියන, පිරිනිවන් නොයන; තුන්ලෝනැති, තුන්ලොකයෙහිම නැත්තාවූ; සතරඉරියව් වෙන්, සතරාකාර ඊර්‍යාපථයෙන්; රුසිරිදී, රූපශ්‍රී දෘනය කොට; දම්දෙසුවන්, ධර්‍මදෙශනාකළ; බුදුන්, සර්‍වඥයන්; වඳිමි, නමස්කාර කෙරෙමි.

51 ආදිමල සමණින්
පසුවමලද, ගෙණදවාපු
නවත් නොමල දූරියෝ
පතත් තුන්වනවර මියන්නත්.

ආදිමල, ප්‍රථමබොධියේදී කෙලශයන් පරිනිර්‍වාණය කළාවූ; සමණින්, ශ්‍රමණයන්;(ගෞතම සර්‍වඥයන්) පසුවමලද, දෙවෙනිව සකන්ධපරිනිර්‍වාණයකාල කාලයෙහි;ගෙණදවාපූ, ඇරගෙණ ආදාහණකළ; නවත් නොමල, දෙවනුත් නොමලෝය; දූරියන්, සීරයෝ; තුන්වනවර මියන්නන්, තුන්වෙනි පරිනිර්‍වාණයෙන් වන්නවුන්; පතත්, ප්‍රාර්ථනා කෙරෙත්.

52 එසා සත් සෙනගක්
එක ඇතු පලාගියද
අඹා පසල දීගොසින්
ලූණු බැඳානත්තු වල්පත.

එක, අනගායවූ; ඇතුපලාගියද, ඇත්ගොච්චන් හා ගිය දිනයෙහි; එසා, එපමණවූ; සත්සෙනගක්, සප්තසෙනාවක්; ගොසින්, ගමනයකොට; පසලදී, ප්‍රාප්තස්ථානයේදී; (පර්‍ණශාලාවේදී) අඹා, එක්ව; එණුබැඳ, කරුණාවබැඳ; වල්පතගත්තු, වනයට පැමිණියෝ.

53 මතුබලල් මස් මී
වනපලා මල්ලා
බුදුවන්ගෙ සැබැවින්
නවත් රත් නම්පලා දෙනුවන්

ති, ඥානයෙන්; නම්, මෝහය; පලා, දුරුකොට; බිතා පලා, වනයටපැමිණ; මතු, හියද, බලල්, පුතුයන්ද; මස්, මාංසද; මල්ලා, අඹුවන්ද; තවත්, නැවතත්; රන්, ලේද; දෙනුවන්, ඇස්ද; දී, දානයකොට; බුදුවූන්නේ, සර්වඥ වන්නේ; සැබවින්, ඒකාන්තයි.

54 සැයි සැයි දූරි
සඳද ම,දපියාදත්
බැවී මෙතෙක්ද සතර
වනද කැය කිරිබත්

සැයිදූරී, ශාක්‍යසිංහ ධීරතෙම; සඳද, ඡද්දන්තජාතක යෙහිදී, සැයි, සාහසිකව; දත්මැදපියා, දළකපාදී; මෙතෙක්ද, මෙතෙක්ජාතියෙහි; බැවී, භාවනාකොට; සතර වනද, සම්ඥවනජාතියෙහි; කිරිබත්කැය, කිරිපිඬු අනුභාව කෙළේයි.

55 මෙවර ම දෙකුඹුරේ
කර තණ්හ පුරානැංගේ.
සිතුරි නොනැංගේ
එයින් දමල නොලා හුන්නෙම්

මෙවර, මෙසමයට; ම, මාගේ; දෙකුඹුරේ, දෙගනැමති කෙතෙහි; කර, කණිශවූ; තණ්හ, තෘෂ්ණාව; පුරානැංගේ, සම්පූර්ණව නැංගේය; සිතරි, අසම්ගතාසමෘතිභාවනාව; නොනැංගේ, හටනොගත්තේය; එයින්, එසේහෙයින්; දම, ධර්මයෙහි; ලනොලා, සිත්හි නොපිහිටුවා; හුන්නෙම්, සිටියෙමි.

56 තණ්හගේ විදැහැර
බෝපා අඩවියේ ඉඳ
සද්ද මුලුල්ලේ
එදූරි දවසැරි පලාකාලා

එදූරි, ඒ ධීරතෙම; තණ්හ ගේ විදැහැර, තෘෂ්ණාව නැමති ගේ විදැහැරලා; බෝපාඅඩවියේ හිඳ, බොධිමණ්ඩාරණ්‍යයෙහි ඉඳ; සද්දමුළුල්ලේ, සත්දින මුලුල්ලෙහි; පලාකාලා, නිවන්ඵල අනුභවකොට; දවසැරි, දවස්හැරියේයි.

57 සුනුවත හැරපියා
උප්පත මග හෙළාගෙණ
දූන් සතුටුව කොසිද
නැතත්ඛිනි දිවන්තේ

සුනු, පුත්‍රයන්ද; වත, වස්තූන්ද; පියා, අඹුන්ද; හැර, පහකොට; මග, මාර්ගඥානය; උප්පතහෙළාගෙණ, උත්පත්තිකොටගෙණ; දූන්සතුටුව, ධ්‍යානයෙන් සන්තුෂ්ටව; නැතත්ඛිනී, ඥානාර්ථයෙන්; දිවන්තේ, දිවසන්තේ; කොසිද, කවරස්ථානයකටද.

58 අඳුසට දෙමස්සක්
පෙර දිලාව සමණෝ
දූන් සතරක් ලද්දූ
වරෝ රත්කෙළිසට දූරිගෙනි

සමණෝ, ශ්‍රමණයෝ; පෙර, පූර්වජාතියෙහි; අඳුසට, අඬයාට; දෙමස්ඵුක්දීලා, මසැස්දෙකක්දී; දූත්, මේ කාලයෙහි; සතරක්ලද්දූ, සම්භාවයක් ලැබූහ: දූරිගෙනි, ධීරයෙනි; රත්කෙළිසටවරෝ, වනයෙහි (තපස්) ක්‍රීඩාවට එව්.

59 කුදලා සමන ගොස්
සත් රජගෙක හොපොල්ලෝ
රත්දි රිදීගෙණ
තවත් තණ්ද දූත් රජකලෝ

කුදලාසමන, කුද්දලසමානමයෙහි; සත්රජයෙක හොපොල්ලෝ, සප්තරාජධානියෙක රජවරු; ගොස්, ගමනය කොට; රත්දි, වනයෙහි; රිදීගෙණ, සෑහිලපදවා; තවත්, නැවතත්; තණ්ද, තෘෂ්ණාවදුරුකොට; දූත් රජකලෝ, ධ්‍යානයෙන් රාජ්‍යය කලෝය.

නිමි